

# පමා නොවී එම් අකුරට

දිගු කලකට ඉහත මා විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ අපේ කණ්ඩායමේ කුරුවිට නම් වූ ශිෂ්‍යයෙකු විය. රජරට සිය නිජ බිම කරගත් කාල වර්ණ චර්ම කල්‍යාණයෙන් යුතු අඩි පහක් පමණ උසැති කුරුවිට කාගේත් සිත් දිනාගත් විනෝදකාමී පුද්ගලයෙකි. සෑම විශ්ව විද්‍යාල සිසුවෙකුට ම වාගේ ඔහුට ද අන්වර්ථ නාමයක් පට බැඳ තිබුණි. එය කේ සෙවන් කුරේ නම් විය. කුරේ යනු කුරුවිට යන වාසගමේ කෙටි ඇමතුම් නාමයයි. කේ සෙවන් යන්නෙන් අදහස් කෙරුණේ ඉංගිරිසි කේ අකුරු සප්තකයකි. කළු, කොට, කෙට්ටු, කැත, කපටි, කුපාඩි යනාදී විශේෂණ පද හතක් කේ සප්තකයෙන් නිරූපනය විය. මේ අන්වර්ත නාම වලින් සාමාන්‍යයෙන් හුදු විනෝදය මිස කිසිදු අපහාසයක් අදහස් නොකෙරුණු බව කිව මනාය.

මා අද කතාකරන්නේ කේ සප්තකයක් ගැන නොව කේ ත්‍රිත්වයක් එනම් කේ.කේ.කේ ගැනය. කේ.කේ.කේ නමින් සාමාන්‍යයෙන් නම් හැඳින්වෙන්නේ ඇමෙරිකාව මූලස්ථානය කොට ගෙන ක්‍රියාත්මක වේ යැයි සැලකෙන කූ කුකල්ස් ක්ලැන් (කේ.කේ.කේ) නම් වූ කුප්‍රකට අන්ත ජාතිවාදී සුදු සංවිධානයකි.

එනමුදු, මගේ කෝෂ්ඨාගාරයේ කේ.කේ.කේ නමින් අදහස් වෙන්නේ කොට කලිසම් කාරයෝ යන්නයි. මා "පමා නොවී එම් අකුරට" යන මැයෙන් මා ලියන මේ කොලමේ මුල් පියවර සඳහා මේ මාතෘකා නාමය යොදා ගත්තේ ඒ ඇසුරෙන් මගේ ගැටවර දිවියේ එක්තරා අත්දැකීමක් ඔබ හා බෙදා ගැනීමටයි.

"පමා නොවී එම් අකුරට" යන යෙදුම ඉගෙනීමේ යහපත් ප්‍රතිඵල ගැන ලියවුනු කවි පන්තියක එන්නකි. මගේ මේ කොලම සඳහා මා මේ පදය යොදා ගන්නේ "අප්පමාදෝ අමත පදං" යන පාලි පාඨයට විකල්පයක් වශයෙනි. ධම්ම පදයේ එන ඒ පාලි පාඨය වනාහී මා කලක් උගත් කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදර්ශ පාඨයයි.

දැන් කිසියම් පැහැදිලි කිරීමක් කල යුතු ම වේ.

කලකට ඉහත මෙල්බර්න් නුවර කුලී නිවසක පවත්වාගෙන ගිය චමරියක එක හැලියේ බත් කමින් වසරකටත් වඩා සාමූහිකව ජීවත් වෙමින් සිට, පසුව සිත් අමනාපකම් ඇති කරගෙන වෙන්වූ පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු, අනෙකා ගැන සඳහනක් කරමින් "ඕකා ඉගෙන ගත්තේ ආනන්දේ කියලා කිව්වට, මේ, පස්සෙ

## කොට කලිසම් කාරයෝ

ඉස්කෝලෙට ආපු එකෙක්" යැයි මා සමඟ කීවේය. එතෙක් ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත් සිසුන් අතර එවැනි බේදයක් ගැන දැන නොසිටි මගේ සිත තුල ඒ ප්‍රකාශය නිසා ඇතිවූ ඉච්ඡා භංගත්වය නිසා දෝ, ඉන් පසු සෑමවිටම මගේ පෞද්ගලික විස්තර විමසන අයට මා පවසන්නේ "මං උසස් පෙල කළේ ආනන්දේ" කියා ය.

නමුත් ඇත්ත වශයෙන්ම මා ආනන්දයේ ඉගෙනුම ඇරඹුවේ දහයේ පන්තියෙනි. එතැන් සිට වසර හතරකුත් මාස හයකට පසු පාසැලෙන් අස්වෙන තුරුම දිනපතාම පාහේ පාසැල් ගියෙමි. කණිෂ්ඨ විද්‍යාලයේ සිටි පස් වසරට පසු මා වැඩි කාලයක් ශිෂ්‍යයෙකුව සිටියේ ආනන්ද යේ ය. "අප්පමාදෝ අමත පදං" යන පාලි පාඨය මා හද බැඳ ගත්තේ ඒ නිසාවෙනි. "පමා නොවී එම් අකුරට" නමින් මේ කොලම නම් කෙරුවේද ඒ නිසාවෙනි.

* * * *

නමය වසර අග දී ජා.පො.අ.ස. විභාගය සමත් වී දහය වසරේ සිට උ.ජා.අ.ස. හැදෑමට ආනන්දය ට පැමිණීම මගේ ද මගේ පන්තියේ සගයන් ගේ ද ජීවිතවල වැදගත් සන්ධිස්ථානයක් විය. මේ හැත්තෑව දශකයේ අග භාගයයි. මම ජීවිතයේ පහලොස් වන වසර ගෙවමින් ගැටවර වියට එළැඹෙමින් සිටියෙමි. අපට තනිවම ගමන් බිමන් යන්නට නිදහස ලැබුනේ ද, අපේ අතේ සුළු වශයෙන් හෝ මුදල් ගැවසෙන්නට පටන් ගත්තේ ද මේ සමගය.

අපේ මේ ගැටවර වියේ එක් සිහිනයක් වූයේ එතෙක් අඳිමින් සිටි කොට කලිසමට ආයුබෝවන් කියා දිග කලිසම් ඇඳීමට පටන් ගැනීමයි. නමුත්, දහවන ශ්‍රේණියේ ආනන්දේ ඉගෙනීම ඇරඹුවද මට එම වාසනාව එක්වරම උදා නොවුණි. මා පමණක් නොව මරදාන-බොරැල්ල පාර අද්දර ගොඩනැගිල්ලේ ඉහල මාලයේ පිහිටි මගේ පන්තියේ සිටි සිසුන් තිස් හය දෙනාගෙන් අඩු වශයෙන් දහ දෙනෙක් පමණ දෙනා තවමත් දිග කලිසම් සිහිනය සැබෑ කර නොගත්තෝ, එනම්, කේ කේ කේ ලා හෙවත් කොට කලිසම් කාරයෝ වූහ.

මා ද ඇතුළු කේ කේ කේ ලා බොහෝ දෙනෙකු තවමත් එතරම් උස මහතට වැඩුනු කොල්ලන් නොවුනි. එනිසා කොට කලිසම තවදුරටත් ඇඳීමේ මහා ප්‍රශ්ණයක් අපට නොතිබුන බව කිව හැකිය. එසේ වුවද, අප පිරිස අතර සිටි සුනෙත් කරුණාප්‍රේම මිතුරා නම් ඒ වන විටත් වයසටම සරිලන උස මහත තරුණයෙකු වූ නිසා අපේ පන්තියේ කොට කලිසම් කාරයින් අතර ඔහු හොඳින් කැපී පෙනුනි.

නිරිත දිග මුහුදු කලාපය නිජ බිම කරගත් සුනෙත්, එඩිතර චරිතයක් ඇත්තෙකු වූවේය. ඕනෑම අසාධාරණයක් ඉවසා ගෙන ඉන්නට කුඩා කල සිටම අප බොහෝ දෙනෙකු පුරුදු වී සිටිය ද සුනෙත් නිසැකවම ඒ මානසිකත්වය පරයා වැඩුණු අයෙක් බව පෙනුණි.

අප උ.ජා.අ.ස. හැදෑරීම සඳහා දහය වසරට ආනන්දයට බැඳුන ද මුලදී අපට ඉගැන්වීමට වැඩිපුරම යොදා තිබුනේ උසස් පෙල ගුරුවරුන් නොව සාමාන්‍ය පෙල ගුරුවරුන් ය. ටික කලකින් ම ඇතිවූ දේශපාලන පෙරලිය සහ ඒ සමගම අනිවාර්‍යයෙන්ම ඇතිවන අධ්‍යාපන විප්ලවය නිසා සියල්ල කණපිට හැරුණි. මෙයින් ටික කලකට පසු සිදුවූ එක් සුහදායී වෙනස් කමක් වූයේ අපට ජීව විද්‍යාව ඉගැන්වීමට උසස් පෙලට උගන්වන ගුරුවරියක් පැමිණීමයි. එසේ වුවද, ජීව විද්‍යාව හැර දමා තව මාසයකින් පමණ උසස් පෙල ගණිතය හදාරන්නට සැදී පැහැදී සිටි අප පිරිසෙන් හරි අඩක් පමණ පිරිසකට මේ ගුරුවරිය ගේ පාඩම් වැදගත් නොවුණි. ඒ කෙසේ වෙතත් අපි සුපුරුදු පරිදි පාඩමට සවන් දුන්නෙමු. සටහන් ලියා ගත්තෙමු. එනමුදු, තවදුරටත් එසේ කළේ සුනෙත් නොවේ. ජීව විද්‍යාව පරිච්ඡේදය ඇරඹුනු සැනින් ඔහු පුවත් පතක් පෙරලා ගත්තේ ය. සැනසිල්ලේ එය කියවන්නට පටන් ගත්තේ ය. පාඩමට අවධානය යොමු නොකරන්නේ ඇයි දැයි ගුරුවරිය විමසූ විට ඔහු නිබයව කියා සිටියේ "ටීචර්, මම ඒ ලෙවල්ස් වලට කරන්න යන්නේ මැත්ස්, ඒක හින්දා මට බයලොජි ඉගෙන ගෙන ඇති පලක් නෑ" කියාය.

ඇත්ත කියන්නට බිය විය යුතු නැති බව අප සියළු දෙනාම අසා සිටියෙමු. ඒත් සුනෙත් තරම් එඩිතර අන් අයෙකු එදා අප අතර නොවීය.

දැන් මගේ මේ කතාවේ කූටප්‍රාප්තියට පැමිණෙන්නම්.

අපට ඉංගිරිසි විෂයය ඉගැන්වූයේ දසනායක නම් වූ ගුරුවරියකි. දිනක් එක්තරා ඉංගිරිසි වදනක අර්ථය ඇය තේරුම් කර දෙමින් සිටියදී, සුනෙත් එකවරම පවසා සිටියේ ඒ හා සමාන නමකින් ඇමෙරිකානු පොප් සංගීත කණ්ඩායමක් ද ඇති බවයි. ඒ තැනට නොගැලපෙන සහ බාධාකාරී කතාව අසා කෝපයට පත් වූ දසනායක ගුරුවරිය, සුනෙත් ට බැන වදිමින් ඔහුට නැගී සිටින්නට අණ කළාය. අසුනෙන් නැගිට සිටගත් මේ උස මහත සිසුවා දුටු සැනෙන්, ඔහු කොට කලිසමකින් සැරසී සිටි නිසාදෝ, ඇය ගේ මුවට සිනාවක් නැගුණි. පාඩමට අදාල නොවන දේ කියා බාදා කිරීම ගැන සුනෙත් ට දොස් පවරද්දී ඇගේ මුවින් "ඇවිත් මෙතන ජංගි කොටයක් ඇඳගෙන" වැනි වදන් කිහිපයක් පිටවිය.

සුනෙත් ගේ නිර්භය කම, අසාධාරණය නොඉවසීමේ ගතිය, මා ඉතා හොඳින් දුටුවේ එදාය. "ටීචර් අපේ දුප්පත් කම ගැන ඔහොම හිනාවෙන එක හරිද?" ඔහු අසා සිටියේය. "අපේ දෙමව්පියන් දුප්පත් නිසා, අපි අපිට තියෙන විදියට කොට කලිසමක් හරි ඇඳගෙන අපි ඉස්කෝලෙ එනව. දුප්පත් වීම වරදක් ද ටීචර්?" ඔහු ප්‍රශ්ණ කළේ, දසනායක ගුරුවරිය තුෂ්නිම්භූත කරමිනි. සාමාන්‍ය භාෂාවෙන් කියනවා නම් ඇයට කට උත්තර නැතිවිය.

පාසැල් සිසුවෙකු විසින් තම අයිතීන් රැකගැනීමට හෝ සමාජ අසාධාරණයට එරෙහිව කළ මා දුටු හොඳම ඒකල සටන එයයි.

පසුව කොතලාවල ආරක්ෂක පීඨය හරහා ඉංජිනේරු උපාධියක් දිනාගත් කරුණාප්‍රේම, කලක් රජයේ හමුදාවේ නිලධාරියෙකු ලෙස සේවය කොට ඉන් මිදුණු පසු පෙර පිං බලයෙන් වීසා ලොතරැයිය දිනා එක්සත් ජනපදයට සංක්‍රමණය කළේය. එහිදී ඔහු එක්සත් ජනපද යුධ හමුදාවේ සාමාන්‍ය භටයෙක් ලෙස සේවයට බැඳුණි.

පැය කිහිපයක් ඇතුලත ගුවන්ගත වී ලෝකයේ ඕනෑම තැනකට පැරෂූටයකින් බැසීමට තමා සූදානමින් සිටිනා බව සාජන්ට් කරුණාප්‍රේම කලකට පෙර මට විද්‍යුත් ලිපියක් මගින් දැන්වීය.

එදා කොට කලිසන් කාරයන් පසු කලෙක, ඇවැසි නම්, ලොවම පාලනය කළ හැකි අය වූයේ එලෙස ය.

රසික සූරියආරච්චි

23 වන පිටුවෙන් (කවිය ගීතය )

සතතාභ්‍යාසයේ යෙදෙමින් සිය ව්‍යුත්පත්තිය වර්ධනය කරගත යුතුය. එය එක රැයකින් කළ හැකි කටයුත්තක් නොවේ. මින් පෙර නොයෙදු වචනයක් ගීතයට යෙදූ පමණින් එය සාර්ථක අත්හදා බැලීමක් ලෙස සැළකිය නොහැකිය. කිසිවෙකු "පඩික්කම" යන වචනය යොදා ගීතයක් රචනාකළ හොත් එම අළුත් වචනය හේතුවෙන් එය සුභාවිත ගීතයේ නිම් වළලු පුළුල් කරනු ලබන අත්හදා බැලීමක් වනු ඇද්ද ? සැබැවින්ම නැත. රචකයා භාවිතා කරනු ලබන කවරාකාර වදනක් වුවද නිර්මාණයේ අර්ථය උද්දීපනය කරනු වස් මුඛ්‍ය අර්ථය සමඟ ඓන්ද්‍රියව නොබැඳෙයිද එම වචනය මතු පිටින් එල්ලන ලද සාටෝපවත් සැරසිල්ලක් පමණි. එමඟින් ගීතයේ මුළු මහත් ප්‍රකාශය ගැඹුරින් ඔසවා තැබීමක් සිදු නොවේ. සිංහල ගීතය තුළ පර්යේෂණාත්මක ලෙස භාෂාව පරිහරණය කොට ප්‍රබල අරුත් ගීතයට කැඳවාගෙන පැමිණි රචකයන්ගේ ගීත අධ්‍යනය කිරීමෙන් මෙම අවුල ලිහාගත හැකිය. ඒ සඳහා කෙටි මාර්ග (Short Cut) නැත. හොඳ නිර්මාණකරුවෙකු වීම යනු දිගු අභ්‍යාසකාලය පලයකි.

ඉතා හොඳ ගේය පද රචනා කළ ද ඒවා සංයුක්ත තැටියක් ලෙස රසිකයාට තිළිණ කළ හැකි ආර්ථික සවියක් නොලද අප රටෙහි වෙසෙන ඇතැම් තුරුණු ප්‍රතිභාවන්තයන්ට වඩා "උඩුගං බලා" රචකයා වාසනාවන්ත වී තිබේ. එම මහඟු වරම වඩාත් අර්ථවත් ලෙස භාවිත වූයේ නම් සුභාවිත ගීතයට පෙම් බැඳි අප සහෘදයනට නැවුම් ආශ්වාදයක් ඉන් තිළිණ වන්නට තිබුණි. සාර්ථක භාෂාමය අත්හදා බැලීම් රැගත් රචනා මා කිහිප විටකදී "විදර්ශන" තුළින් ඉදිරිපත් කොට තිබේ. නිර්මාණයක රුව ගුණ නොදැකීමේ කුහක කමක් අපට නැත. එහෙත් "වන්දනය", "පිට කැසීම" හා "ඇන්දවීම" යන තුන්දොස් අපි බැහැර කරමු. අප කළ යුත්තේ නිර්මාණකරුවන්ගේ නිර්මාණයේ දිග පළල පිළිබඳ යාථාර්ථවාදී රූපයක් ඔහුට පිරිනමා ඒ මතින් ඔහුගේ ගමන ශක්තිමත් කිරීමයි. "ඇන්දවීම" යනු ඔහුගේ මගට මිත්‍රවේශයෙන් කරනු ලබන අකුල් හෙලීමකි. වේදිකාවක් මතදී අපට ඒ "මහා පව්කාරකමට" අත ගැසිය නොහැක්කේ එබැවිනි.

විචාරයක් ඉවසා සිටිය නොහැකි නම් ඔහු හෝ ඇය නිර්මාණ කිරීමෙන් වැළකී සිටිය යුතුය. එය ඉවසා සිටීම වූ කලි නිර්මාණකරුවා සතු පරිණතභාවය විහිදා දක්වන කැටපතකි. සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය විවිධ නිර්මාණ අරඹයා හටගත් ප්‍රකට විචාර කථිකා ගහන වූවකි. ඒවා කෘති හරහාද සමාජ ගතවී තිබේ. සිංහල ගීත විෂයෙහි මහාචාර්‍ය සුචරිත ගම්ලතුන්ගේ විචාර මතවාද වඩාත් විසංවාදයට බඳුන් වූ එළැඹුමක් විය. ඔහු ඇතැම් ජනප්‍රිය ගී ප්‍රබල විවේචනයට ලක් කළ අතර එය ගීත රචකයාගේත් සහෘදයා-ගේත් දෘෂ්ටිමය නිම්වළලු පුළුල් කරන්නට මහත් පිටුබලයක් වුණි.

එමෙන්ම එම වකවානුව තුළ ගීත රචකයා සිය ගේය පද වඩාත් අර්ථපූර්ණ කරගනුවස් ප්‍රෝත්සාහි වනු දක්නට ලැබුණි. ඔවුහු තම ගීතය තුළ ඇති ගැඹුර පිළිබඳ පෙරලා ප්‍රතිකථන කරන්නට උත්සහ නොකළ අතර ඒ වෙනුවට එම විචාරයන්හි ගත යුතු හරය අවශෝෂණය කොටගෙන නොවැදගත් දේ බැහැර කළෝය. එහි වෛරයක් නොවුණි. කිසිදු ශාස්ත්‍රීය පසුබිමක් නොමැති "වැඩ බැරි ටාසන්ලා" මගින් පුවත්පත් පිටු දූෂණය කරනු වෙනුවට අර්ථවත් කථිකාවකට අවැසි ශාස්ත්‍රීය එළැඹුමකට එමඟින් දොරටු විවර කළේය. අපට අවශ්‍යව ඇත්තේ එබඳු ගැඹුරු සංවාද මණ්ඩපයකට ගොඩවීමටය. එහෙත් එහි එළැඹුම බුද්ධිමය ප්‍රශ්න කිරීමකින් තොරව භාවමූලික කුලප්පුවීම් දක්වා වර්ධනය වන්නේ නම් එය කවර දුර්භාග්‍යයක්ද ?

"උඩුගං බලා" සංවාද මණ්ඩපයේදී එකද බුද්ධිමය ප්‍රශ්නයක් හෝ අප වෙත එල්ල නොවුණි. ඒ වෙනුවට අපගේ හඬ නිහඬ කොට දේශකයන් කෙටවීමේ අති ප්‍රාථමික අඩියකට එය ඇද වැටුනි. අප අපගේ මත සියලු දෙනා පිළිගත යුතුය යන "හිට්ලර් ආස්ථානයේ" නොසිටිමු. ඒවා බුද්ධිමය සංවාදයකට පාත්‍ර කිරීමෙන් වඩාත් තර්කානුකූල මතය පාදා ගැනීමට සහෘදයාට අවස්ථාව විවර විය යුතුය. සහෘදයන් ප්‍රශ්න කළ යුත්තේ අප ඉදිරිපත් කළ කරුණු වල ඇති නිරවද්‍යතාව පිළිබඳව මිස අපට එවැනි මත ප්‍රකාශ කිරීමට ඇති අයිතිය පිළිබඳ නොවේ. මත පලකිරීමේ අයිතිය කිසිවෙකුට උදුරා ගත නොහැකිය. එය පිළිගැනීම හෝ නොගැනීම තම තම නැණ පමණින් සිදුවන්නකි. අප කණගාටුවට පත් වන්නේ ලොව කීර්තිමත් සරසවි පියසක් යට වල්වැදී ගිය මෙම වටිනා හෝරා කිහිපය පිළිබඳවයි. බුද්ධිමය සංවාදයක් වෙනුවට මතවාද නොඉවසන භාව මූලික කුලප්පුවීම් කුමන නමකින් හඳුන්වන්නේදැයි අපි නොදනිමු.